වගා සහනාධාර චක්‍රලේඛ අංක : 69

කුඩා තේ වතු සංවර්ධන අධිකාරිය,
අංක 70, පාර්ලිමේන්තු පාර,
පැලවත්ත, බත්තරමුල්ල.
2012.02.24 දින.

සියළුම ප්‍රාදේශීය කළමණාකරුවන්,

## තේ නැවත වගාව සහ අළුත් වගාව යටතේ ගෙවනු ලබන සහනාධාර මුදල වැඩිකිරීම.

තේ නැවත වගාව සහ අළුත් වගාව සඳහා ගෙවනු ලබන සහනාධාර මුදල 2012.01.01 දින සිට බලපැවැත්වෙන පරිදි පහත සඳහන් ආකාරයට වැඩිකරනු ලැබේ.

ඉහත වගාක්‍රම වලට අදාලව 2012.01.01 දිනට ප්‍රථම නිකුත් කරන ලද අවසරපත්‍ර සඳහා එකී අවසරපත්‍ර නිකුත් කරන අවස්ථාවේදී දන්වා ඇති සහනාධාර මුදල් ප්‍රමාණය ඒ ආකාරයටම ගෙවිය යුතුය.

### 1. තේ නැවත වගාව

ක්ෂේත්‍ර පරීක්ෂණ වාර්තා මගින් ලබාදෙන නිර්දේශ පදනම්ව පහත සඳහන් පරිදි පස සාරවත් කිරීම සහිතව හා පස සාරවත් කිරීමෙන් තොරව තේ නැවත වගාව සඳහා අවසරපත්‍ර නිකුත් කිරීමට කටයුතු කළ හැකිය.

#### (අ) පස සාරවත් කිරීම සහිතව - තේ නැවත වගා කිරීම

i. පස සාරවත් කිරීම සහිතව තේ නැවත වගාව සඳහා ගෙවනු ලබන සහනාධාර මුදල සියළුම තේ වගා කලාප සඳහා හෙක්ටයාරයකට රුපියල් 300,000/- ක් වන පරිදි සංශෝධනය කර ඇති අතර එම මුදල පහත දැක්වෙන අයුරින් ගෙවීමට කටයුතු කල යුතුය.

| වාරිකය | හෙක්ටයාරයකට රුපියල් |
|---|---|
| 1. බිම් සැකසීම | 80,000 |
| 2. පස සාරවත් කිරීම -I | 30,000 |
| 3. පස සාරවත් කිරීම -II | 120,000 |
| 4. තේ වගා කිරීම | 40,000 |
| 5. නඩත්තුව | 30,000 |
| එකතුව | 300,000 |

ii. පස සාරවත් කිරීම සහිතව තේ නැවත වගාව යටතේ එක් ඉඩම් හිමියෙකුට වසරකට අවසරපත්‍ර නිකුත් කරන උපරිම බිම් ප්‍රමාණය හෙක්ටයාර් 01 කට සීමා කෙරේ.

(ආ) පස සාරවත් කිරීමෙන් තොරව - තේ නැවත වගා කිරීම

i. මෙම අවසරපත්‍ර සඳහා ගෙවීම් කිරීමේදී පස සාරවත් කිරීම රහිතව පහත සඳහන් පරිදි හෙක්ටයාරයකට රුපියල් 225,000/- ක් වනසේ ගෙවීමට කටයුතු කළයුතුය.

| වාරිකය | හෙක්ටයාරයකට රුපියල් |
|---|---|
| 1. බිම් සැකසීම<br>2. තේ වගා කිරීම<br>3. නඩත්තුව | 80,000<br>115,000<br>30,000 |
| එකතුව | 225,000 |

ii. පසේ සාරවත් භාවය පවතින ඉඩම් සඳහා පමණක් පස සාරවත් කිරීමෙන් තොරව වගා කිරීම සඳහා අවසරපත්‍ර නිකුත් කරන අතර එම අවසරපත්‍ර අංකයෙහි මුලට RP/A ලෙස පරිගණක මුද්‍රිත අක්ෂර සටහන් කළයුතුය.

iii. මේ සඳහා තේ පරීක්ෂක/ව්‍යාප්ති නිලධාරී මගින් RP/NP- 4 මූලික පරීක්ෂණ වාර්තාව සමග මේ සමග ඇති (ඇමුණුම 01) මාර්ගෝපදේශයට අනුව RP/NP- 4A ආකෘතිය මගින් පස පුනරුත්ථාපනයෙන් තොරව තේ නැවත වගාවට යෝග්‍යතාවය පිළිබඳව නිර්දේශය ලබාදිය යුතුය.

iv. මේ යටතේ නිකුත් කරන අවසරපත්‍රවල වර්ෂයක් ඇතුළත පැල සිටුවීම සම්පූර්ණ කළයුතුවේ.

v. මෙම අනුග්‍රහය ලබාදෙනුයේ මුළු ඉඩම් අයිතිය අක්කර 01 ක් හෝ ඊට වඩා අඩු කුඩා තේවතු හිමියන්ට වසරකට උපරිම වශයෙන් අක්කර 1/4 ක් නැවත වගා කිරීම සඳහා පමණි.

## 2. තේ අළුත් වගාව

ක්ෂේත්‍ර පරීක්ෂණ වාර්තා මගින් ලබාදෙන නිර්දේශ පදනම්ව පහත සඳහන් පරිදි පස සාරවත් කිරීම සහිතව හා පස සාරවත් කිරීමෙන් තොරව තේ අළුත් වගා කිරීම සඳහා අවසරපත්‍ර නිකුත් කිරීමට කටයුතු කළ හැකිය.

(අ) පස සාරවත් කිරීම සහිතව - තේ අළුතින් වගා කිරීම

i. පස සාරවත් කිරීම සහිතව තේ අළුත් වගාව සඳහා ගෙවනු ලබන සහනාධාර මුදල හෙක්ටයාරයකට රුපියල් 150,000/- ක් වන පරිදි සංශෝධනය කර ඇති අතර එම මුදල පහත දැක්වෙන අයුරින් ගෙවීමට කටයුතු කළ යුතුය.

| වාරිකය | හෙක්ටයාරයකට රුපියල් |
|---|---|
| 1. බිම් සැකසීම<br>2. පස සාරවත් කිරීම -I<br>3. පස සාරවත් කිරීම -II<br>4. තේ වගා කිරීම. | 50,000<br>15,000<br>50,000<br>35,000 |
| එකතුව | 150,000 |

ii. පස සාරවත් කිරීම සහිතව අළුත් වගාව යටතේ එක් ඉඩම් හිමියෙකුට වසරකට අවසරපත්‍ර නිකුත් කරන උපරිම බිම් ප්‍රමාණය හෙක්:0.4047 කට (අක්කර 01 කට) සීමා කෙරේ.

(ආ) පස සාරවත් කිරීමෙන් තොරව - තේ අළුතින් වගා කිරීම

i .මෙම අවසරපත්‍ර සඳහා ගෙවීම් කිරීමේදී පස සාරවත් කිරීම රහිතව පහත සඳහන් පරිදි හෙක්ටයාරයකට රුපියල් 120,000 ක් වනසේ ගෙවීමට කටයුතු කළයුතුය.

| වාරිකය | හෙක්ටයාරයකට රුපියල් |
|---|---|
| 1. බිම් සැකසීම | 50,000 |
| 2. තේ වගා කිරීම | 70,000 |
| එකතුව | 120,000 |

ii. වෙනත් වගාවක් නොතිබුණ පසේ සාරවත් භාවය පවතින ඉඩම් සඳහා පමණක් පස සාරවත් කිරීමෙන් තොරව අවසරපත්‍ර නිකුත් කල හැකි අතර එම අවසරපත්‍ර අංකයෙහි මුලට NP/A ලෙස පරිගණක මුද්‍රිත අක්ෂර සටහන් කළයුතුය.

iii. මේ සඳහා තේ පරීක්ෂක/ව්‍යාප්ති නිලධාරී මගින් RP/NP - 4 මූලික පරීක්ෂණ වාර්තාව සමග ඇමුණුම - 01 මාර්ගෝපදේශයට අනුව RP/NP- 4A ආකෘතිය මගින් පස පුනරුත්ථාපනයෙන් තොරව තේ අළුත් වගාවට යෝග්‍යතාවය පිළිබඳව නිර්දේශය ලබාදිය යුතුය.

iv. මේ යටතේ නිකුත් කරන අවසරපත්‍රවල වර්ෂයක් ඇතුළත පැල සිටුවීම සම්පූර්ණ කල යුතුය.

v. පස සාරවත් කිරීම සහිතව හෝ රහිතව තේ අළුත් වගාව සඳහා එක් ඉඩම් හිමියෙකුට වසරකට අවසර ලබාදෙන උපරිම බිම් ප්‍රමාණය හෙක්ටයාර් 0.4047 කට (අක්කර 01 කට) සීමාවේ.

මෙම චක්‍රලේඛය ලද බවත්, ඒ අනුව ක්‍රියාකරන බවත් සනාථකල යුතුය. ඔබගේ සියළු කාර්ය මණ්ඩලය මේ පිළිබඳව දැනුවත් කළයුතු අතර, දැන්වීම් පුවරුවේ දැන්වීමක් ප්‍රදර්ශණය කිරීමටද කටයුතු කරන්න.

නොඑල් පද්මසිරි කාරියවසම්
සභාපති.

පිටපත්:

1. නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී(සංවර්ධන/ව්‍යාප්ති)
2. සහකාර සාමාන්‍යාධිකාරී(සංවර්ධන/පරිපාලන/සේවා)
3. අභ්‍යන්තර විගණක
4. මුදල් කළමණාකරු
5. කළමණාකරු(සැලසුම් හා නියමුකරණ/ප්‍රජා සංවර්ධන)
6. සියළුම මාණ්ඩලික නිලධාරීන්
7. සියළුම තේ පරීක්ෂක/ව්‍යාප්ති නිලධාරීන්
8. ගරු සභාපති/ගරු ලේකම්, සමස්ථ ලංකා සමිති සංවිධානය
9. සියළුම ප්‍රාදේශීය සංවිධානවල ගරු සභාපති/ලේකම්

ඇමුණුම - 01

## පස පුනරුත්ථාපනයෙන් තොරව තේ නැවත වගාවට/අළුත් වගාවට යෝග්‍යතාවය නිර්ණය කිරීම සඳහා මාර්ගෝපදේශය.

i. මෙම අනුග්‍රහය යටතේ අවසරපත්‍ර ලබාගැනීමට අපේක්ෂා කරන ඉඩමවල මූලික පරීක්ෂණ අවස්ථාවේදී තේ පරීක්ෂක/ව්‍යාප්ති නිලධාරි විසින් මූලික පරීක්ෂණ වාර්තාව සමග RP/NP-4A ආකෘතියෙන් පස සාරවත් කිරීමෙන් තොරව අවසරපත්‍ර ලබාදීම සඳහා නිර්දේශය ලබාදිය යුතුය.

ii. RP/NP-4A ආකෘතියේ දක්වා ඇති දෘෂ්‍ය නිර්නායක 6 ක් පාදක කොටගෙන එක් එක් නිර්නායකයට අදාලව ඉඩමේ පවත්නා තත්වය සළකා බලා ලකුණු ලබාදීම සිදුකල යුතුය.

iii. නිර්නායක 6 ම ඒකාබද්ධව සළකා බලන විට ලැබිය හැකි උපරිම සමස්ථ ලකුණු ප්‍රමාණය 17 කි. සලකා බලන ඉඩමේ සමස්ථ ලකුණු එකතුව ලකුණු 10 ක් හෝ ඊට වැඩියෙන් ලබාගන්නා විටදී පමණක් පස සාරවත් කිරීමෙන් තොරව තේ අළුත්වගාව/නැවත වගාව සඳහා නිර්දේශ ලබාදිය හැකිය.

iv. මෙම අනුග්‍රහය යටතේ සළකා බැලීමට සුදුසුකම් ලබන යම් කුඩා තේ වතු හිමියෙකු පස සාරවත් කිරීම සහිතවම තේ අළුත් වගාව/නැවත වගාව කිරීමට සූදානම් නම් මෙම RP/NP-4A ආකෘතිය මූලික පරීක්ෂණ අවස්ථාව සඳහා ඉදිරිපත් කිරීම අවශ්‍ය නොවන අතර මූලික පරීක්ෂණ වාර්තාවේ වගාකරු පස සාරවත් කිරීම සහිතව අළුත් වගාව/නැවත වගාව කිරීමට කැමති බව සඳහන් කිරීමට කටයුතු කළයුතුය.

# පස පුනරුත්ථාපනයෙන් තොරව තේ අළුත්වගාවට/තේ නැවත වගාවට යෝග්‍යතාවය පිළිබඳ වාර්තාව

( පුනරුත්ථාපනයෙන් තොරව තේ වගා කිරීමට අපේක්ෂා කරන ඉල්ලුම්කරුවන්ගේ ඉඩම් සඳහා සැපයිය යුතු වේ.)

ලුම්කරුගේ නම :.............................................................. අංකය

මේ නම :..............................................................

. තේ අළුත් වගාවට/නැවත වගාවට* යෝජිත ඉඩමේ දැනට ඇති වෘක්ෂලතාවල වර්ධනය :

| දුර්වලයි | මධ්‍යස්ථයි | හොඳයි |
|---|---|---|
| 0 | 1 | 2 |

2. යෝජිත ඉඩමේ දැනට පවතින වෘක්ෂලතා මගින් බිම් ආවරණය:

| 0 -25% | 26-50% | 51-75% | 76-100% |
|---|---|---|---|
| 0 | 1 | 2 | 3 |

3. පසේ ස්වභාවය :

| වැලි අධික | බොරළු අධික | මැටි අධික | ලෝම |
|---|---|---|---|
| 1 | 2 | 2 | 3 |

4. පසේ ගැඹුර :

| <2' | 2'-3' | 3'< |
|---|---|---|
| 1 | 2 | 3 |

5. මතුපිට පස සෝදා පාළුවීමේ තත්ත්වය:

| අධිකයි | මධ්‍යස්ථයි | සුළුයි |
|---|---|---|
| 0 | 1 | 2 |

6. මතුපිට පසේ සරු බව:

| දුර්වලයි | මධ්‍යස්ථයි | හොඳයි | ඉතා හොඳයි |
|---|---|---|---|
| 1 | 2 | 3 | 4 |

සමස්ථ ලකුණු එකතුව :

ඉහත ලකුණු පාදකව මෙම ඉඩමේ පස පුනරුත්ථාපනය සහිතව /රහිතව* හෙක්:............................... (අක්:..........රූ....... පර්....... )ක තේ අළුත් වගා/නැවත වගා* කිරීමට නිර්දේශ කරමි.

දිනය:.................................................. ..............................................................

තේ පරීක්ෂක/ව්‍යාප්ති නිලධාරී

- නිර්නායකයන්ට අදාල ලකුණ කවයකින් සලකුණු කරන්න.
- මුළු ලකුණු එකතුව ලකුණු 10 ක් හෝ ඊට වැඩිනම් පස පුනරුත්ථාපනය රහිතව තේ අළුත් වගාව/නැවත වගාව සඳහා නිර්දේශ කළහැක.

* අදාල නොවන වචනය කපාහරින්න.